**ලංකා පොස්ෆේට් ලිමිටඩ් -2022/2023**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ලංකා පොස්ෆේට් ලිමිටඩ්හි (“සමාගම”) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.34,427,525 ක් වූ ණය ගැති ශේෂය තුළ බොල්ණය ලෙස ප්‍රතිපාදනය කර තිබූ වර්ෂ 05 ට වැඩි අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.9,769,506 ක් වූ අතර විගණිත දිනය වන විටත් මෙම ශේෂයන් අයකර ගෙන නොතිබුණි. | රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු අයකර ගත නොහැකි වසර 10 ට වඩා වැඩි ශේෂයන් විධිමත් පරිදි ලියා හැරීමට මුදල් අමාත්‍යාංශයෙන්ද උපදෙස් ලැබී ඇති අතර, ඉදිරියේදී මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. වාරියපොළ පොල් පොහොර මිශ්‍රණාගාරයට අයත් ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම කඩිනම් කර ඇති අතර, ඔවුන්ගෙන් දෙදෙනෙකු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හැකි සෑම පියවරක්ම අනුගමනය කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී රු.35,867,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු ක්‍රෂර් යන්ත්‍රයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සමාගම් පරිශ්‍රයේ නිෂ්කාර්යව තබා තිබුණු අතර මීට අදාළ රඳවා ගැනීම් රු.4,386,358 ක් ද නිරවුල් කිරීමෙන් තොරව 2014 වර්ෂයේ සිට උපචිත වියදම් ලෙස දක්වා තිබුණි. | මෙම යන්ත්‍රය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ පරීක්ෂණ හේතුවෙන්, එය නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම හා නවීකරණය ප්‍රමාද වී ඇත. යන්ත්‍රය නවීකරණය කර නිෂ්පාදනයට යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් විමසා ඇත. යන්ත්‍රයේ අවශ්‍යතාවය හා අනාගත නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ වාර්තාව ප්‍රකාර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේදී රඳවාගෙන ඇති රු.මි. 4.3 ක මුදල භාවිතා කිරීමට, කළමණාකාරිත්වය තීරණය කොට ඇත. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.35,284,555 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.122,782,789 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.87,498,234 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පොලී හා අනෙකුත් ආදායම රු.72,123,040 කින් වැඩි වී විකුණුම් පිරිවැය රු.55,014,073 කින් අඩු වී තිබුණද විකුණුම් ආදායම රු.195,453,219 කින් අඩු වීම හා කම්හල් හා පරිපාලන පොදු කාර්ය පිරිවැය රු.22,319,835 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.82,925,144 ක බැංකු අයිරාවක් පැවතුණු අතර ඒ සඳහා වර්ෂයේදී රු.9,749,495 ක අයිරා පොලී ගෙවා තිබුණි. | එකඟ වෙමි. රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ හා පොහොර මිල ගණන් ඉහල යාමත් සමග රට තුළ පොහොර භාවිතය හා පොහොර මිශ්‍රණය අඩු වීම නිසා 2022/23 වසර තුල අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 50 ක් පමණක් ළඟාකර ගැනීමට හැකි විය. ඒ අනුව ඇතිවූ මූල්‍යමය අර්බුදය හේතුවෙන් සමාගම සතු ස්ථාවර තැන්පතු ඇපයට තබා බැංකු අයිරා පහසුකමක් ලබා ගැනීමට සිදුවිය. ස්ථාවර තැන්පතු මගින් උපයාගත් පොළී ප්‍රමාණය මෙම අයිරා පොළියට වඩා වැඩිවූ අතර, එය ආයතනයට වාසි සහගත විය. කෙසේ වෙතත්, 2023 මැයි මස අවසාන වනවිට මෙම අයිරා පහසුකම සම්පූර්ණයෙන්ම අවසන් කර ස්ථාවර තැන්පතුද රු.මිලියන 590 ක මට්ටමේ පවත්වාගෙන යාමටද මේ වන විට කටයුතු කර ඇත. | නිසි මූල්‍ය කළමනාකරණය තුළින් පොලී වියදම් අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් සෑම වර්ෂයකම ඇඹරුම් යන්ත්‍ර සඳහා අමතර කොටස් මිලදී ගෙන තිබූ අතර එහිදී තරඟකාරී මිල ගණන් කැඳවීමකින් හෝ දේශීය සැපයුම්කරුවෙකු වෙතින් මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමෙන් තොරව සෘජුවම යන්ත්‍රය මිලදී ගත් ආයතනයෙන් මිලදී ගෙන තිබුණි. තවද, එහිදී අමතර කොටස්වල අවශ්‍යතාවය පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.7,229,928 ක් වටිනා අමතර කොටස් තොගයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු සැලසුම් කර ඇත. | අමතර කොටස් මිලදී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සිදුකළ යුතුය. අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගයීමකින් පසුව අමතර කොටස් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. අනවශ්‍ය පරිදි අමතර කොටස් මිලදී ගත් නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගම නිෂ්පාදනය කරනු ලබන එප්පාවල රොක් පොස්පේට් (ERP) සහ අධිශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) පොහොර තොග වල පැවතිය යුතු පොස්පේට් ($P_2O_5$) ප්‍රතිශතය පරීක්ෂා කරනු | එකඟවෙමි. නිෂ්පාදනය තුළ පැවති යුතු Rock Phosphate ($P_2O_5$) සංයුතිය මනිනු ලබන නව UV- Visible Spectrophotometer යන්ත්‍රයක් ලබාගැනීමට සියළු ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර, ඉදිරි මාස 02 | නිෂ්පාදන අපේක්ෂිත ප්‍රමිතියට නොවීම සමාගමේ විකුණුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින් නිෂ්පාදනවල ප්‍රමිතිය පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබන UV-Visible Spectrophoto යන්ත්‍රය යල්පැන යාම හේතුවෙන් එමගින් ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධ ගැටලු පැනනැගී තිබුණි. අදාළ යන්ත්‍රයෙන් තත්ත්ව පරීක්ෂාවන් සිදුකර අලෙවි කරන ලද පොහොර මෙට්‍රික් ටොන් 3,173 ක තොග අපේක්ෂිත ප්‍රමිතියට අනුකූල නොවීම හේතුවෙන් සමාගම වෙත ආපසු එවා තිබුණි. | තුළ එම උපකරණ සමාගම වෙත ලැබීමට නියමිතය. | |
| (ඈ) | සමාගම විසින් අලෙවි කරනු ලැබූ පොහොර වල පැවතිය යුතු රොක් පොස්පේට් ප්‍රතිශතය අපේක්ෂිත මට්ටමෙන් තොරවීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 1 ක් රු.27,800 ක් වූ අධිශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) මෙට්‍රික් ටොන් 334.30 ක් හා මෙට්‍රික් ටොන් 1 ක් රු.20,000 ක් වූ එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙට්‍රික් ටොන් 334 ක් අලෙවි මිලට ආපසු ලබා දීමේදී රු.2,607,540 ක අලාභයක් සමාගමට සිදුවී තිබුණි. | මෙම පොහොර වර්ග හුවමාරුව හරහා රු.2,607,540 ක අලාභයක් සමාගමට සිදුවී ඇති බව බැලූ බැල්මට සත්‍යයකි. මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින්, සිදුකරන ලද ගණනය කිරීම පදනම්ව හා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය පරිදි HERP මෙ.ටොන් 334.30 ක ප්‍රමාණයක් සැපයීමට කටයුතු කර ඇති අතර, ඒ සඳහා ආයතන විසින් කිසිදු ප්‍රවාහන හෝ අමතර සේවක පිරිවැයක් දරා නොමැති බැවින් සත්‍ය වශයෙන්ම ආයතනට අලාභයක් සිදු වී නොමැත. | නිෂ්පාදන අපේක්ෂිත ප්‍රමිතියට නොවීම සමාගමේ විකුණුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින් නිෂ්පාදනවල ප්‍රමිතිය පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | 2014 වර්ෂයේදී රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 වන විට නවතා දමා තිබූ අතර මුළු ව්‍යාපෘතිය තුළින් රු.මිලියන 31.71 ක අලාභයක් සිදුවී තිබුණි. තවද, ව්‍යාපෘති කාර්යයන් සඳහා පස් අවුරුදු බදු පදනම මත ලබා ගන්නා ලද ඉඩමෙහි බදු කාලසීමාව 2018 සැප්තැම්බර් 05 දිනෙන් අවසන් වී තිබූ අතර බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව නිෂ්පාදන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණද 2022 සැප්තැම්බර් මස සිට සමාගමට ව්‍යාපෘති භූමිය තුළට ඇතුළු වීම ඉඩම් හිමිකාර පාර්ශවය විසින් වළක්වා තිබූ අතර එම ආරවුල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. පළමු වසර 02 ක තුළ මෙම ව්‍යාපෘතිය යහපත් ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණද, ඉන්පසුව අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි වී ඇත. තවද, ඉඩම් හිමිකරු වෙත බදුකුලී ලෙස 2021 ජූනි සිට 2022 සැප්තැම්බර් දක්වා ගෙවිය යුතු රු.480,000 ක මුදලක් අප ආයතනය විසින් මේ දක්වා රඳවාගෙන ඇති අතර, ඔහු සමග එකඟතාවයකට පැමිණීමෙන් පසු පමණක් එම මුදල් නිදහස් කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත. | රු.මිලියන 21 කට අධික ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් බැවින් උද්ගතව ඇති ගැටලු කඩිනමින් විසඳා ගෙන ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබූ TGM 160 ඇඹරුම් යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් පැයකට මෙට්‍රික් ටොන් 10 ක අමතර නිෂ්පාදනයක් සමාගම අපේක්ෂා කර තිබුණි. යන්ත්‍රය 2022 සැප්තැම්බර් මස ස්ථාපිත කර තිබුණද නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට 2023 පෙබරවාරි මස දක්වා කල්ගතවීම හේතුවෙන් අපේක්ෂිත අමතර නිෂ්පාදනය ළඟා කර ගෙන නොතිබුණි. | 2022/2023 වර්ෂයේ සිදුවිය හැකි අනවශ්‍ය පිරිවැය අවම කරගැනීමේ අරමුණින් සත්‍ය අලෙවිය පදනම් කරගෙන නිෂ්පාදන ඉලක්කයන්ද වෙනස්කර ඇත. ඒ අනුව, 2022 සැප්තැම්බර් සිට 2023 පෙබරවාරි දක්වා කාලය තුළ, ඉහත යන්ත්‍රය, නිෂ්පාදනය සඳහා සාර්ථකව දායක කරගෙන ඇති බැවින් යන්ත්‍රය 2023 පෙබරවාරි මස දක්වා නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගත්තාය යන්න පිළිබඳ එකඟවිය නොහැක. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා සැලසුම් සකස් කිරීමට හා සැලසුම්ගත කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාගම විසින් ඛනිජ ඇඹරුම් යන්ත්‍ර සඳහා යොදනු ලබන රබර් බුෂ් ඒකකයක් රු.350 ක් බැගින් දේශීය සමාගමකින් මිලදී ගෙන විගණිත දින වූ 2023 සැප්තැම්බර් 14 දක්වාම යන්ත්‍ර සඳහා භාවිතා කරමින් පැවතුණි. අදාළ භාණ්ඩ ඒකක 81 ක් ගබඩාවේ පැවතියදී තොගය ශූන්‍ය බව දක්වමින් 2022 දෙසැම්බර් 17 දින ඒකකයක් රු.79,082 ක් බැගින් රබර් බුෂ් ඒකක 200 ක් රු.15,816,482 කට ආනයනය කර තිබුණි. ඒ අනුව රු.70,000 ක් වැනි අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීමට හැකිව තිබූ අදාළ අයිතම තොගය ඉතා ඉහළ වටිනාකමකට ආනයනය කිරීම තුළින් රු.15,746,482 ක අලාභයක් සමාගමට සිදුව තිබුණි. මිලදී ගත් මෙම තොගය විගණිත දින වූ 2023 සැප්තැම්බර් 14 වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබූ අතර මිලදී ගැනීමේ දී එම රබර් බුෂ්වලට අමතරව Coupling bolt ඒකක 198 ක්ද ඒ සමඟ ලැබී තිබුණද එම ඇණ වලින් අදාළ යන්ත්‍රයට කිසිදු ප්‍රයෝජනයක් නොමැති බැවින් ඒවා නිෂ්කාර්යව තබා තිබුණි. | මිලදී ගැනීම සම්බන්ධයෙන් දැනටමත් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදුවෙමින් පවතින අතර. අල්ලස් හා දූෂණ කොමිසම් සභාව විසින්ද, පරීක්ෂණ පවත්වාගෙන යනු ලබයි. එසේම ශ්‍රේෂ්ඨාධිකරනයේ පවතින නඩුවකට අදාලව නඩු නිමිත්තක් වශයෙන් මෙම ගැටළුව පවතී. ඒ අනුව එම වාර්තාද පදනම්ව මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.<br>කෙසේ වෙතත්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු සැලසුම් කර ඇති අතර, ඉංජිනේරු මහතුන්ගේ නිර්දේශ මත දේශීයව මිලදී ගත හැකි සියළු යන්ත්‍ර කොටස් හා අමතර කොටස් රට තුළම නිෂ්පාදනය කර මිලදී ගැනීමටත්, එසේම විදේශයන්ගෙන් අනිවාර්යයයෙන්ම ආනයනය කලයුතු අමතර කොටස් ජාත්‍යන්තර මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රමවේද හරහා සිදු කිරීමටත්, සැලසුම් කොට ඇත. | අනාර්ථිකව මිලදී ගැනීම් සිදු කිරීමට වගකිව යුතු සේවකයන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. අනවශ්‍ය පරිදි ලැබී ඇති Coupling bolt තොගය භාවිත කිරීමට/අලාභ අවම වන පරිදි අපහරණයට වැඩපිළිවෙලක් සකස් කළ යුතුයි. මිලදී ගත් රබර් බුෂ් තොගය සුරක්ෂිතව ගබඩා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම අංක LPL/SUP/-HO/F1-B1D/2022/05 දරන ප්‍රසම්පාදනය මගින් රු.86 බැගින් පොහොර ඇසුරුම් මළු 1,200,000 ක් රු.103,200,000 කට මිලදී ගැනීමට සැපයුම්කරුවෙකු වෙත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන | විගණන නිරීක්ෂණය හා එකඟවෙමි. කෙසේ වෙතත්, මෙම ගැටළුව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විභාග කරනු ලබන නඩුවක නඩු නිමිත්තක් ලෙස පවතින හෙයින්, මේ අවස්ථාවේ මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීමට හා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | මාර්ගෝපදේශ 5.4.10 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. සැපයුම්කරු ඇසුරුම් මළු 26,400 ක් රු.86 බැගින් ලබාදී ඉන් පසු සැපයූ මළු 1 ක මිල රු.120 හා රු.147 දක්වා වැඩිකර තිබුණි. මේ අනුව ගිවිසුම්ගතව නොතිබීමෙන් හා කාර්යසාධන සුරක්ෂණ ලබා නොගැනීම හේතුවෙන් රු.61,705,000 කට පොහොර ඇසුරුම් මළු 717,500 ක් මිලදී ගත හැකිව තිබියදී රු.96,407,500 ක් වැය කර මිලදී ගැනීමට සිදුවීමෙන් සමාගමට රු.34,704,500 ක පාඩුවක් වී තිබුණි. | නොකරන බව දන්වා සිටිමි. | නොකළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා වගකිව යුතු පාර්ශව වෙතින් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගමේ TGM-160 Six Roller ඇඹරුම් යන්ත්‍රය සඳහා රු.5,656,344 කට Gear Box උපාංගයක් 2022 වර්ෂයේදී චීනයේ Henan Liming Heavy Industry Machinery Sales Co. Ltd ආයතනය වෙතින් ආනයනය කර තිබුණි. මේ සඳහා තරඟකාරී හා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි. මීට අදාළ 2021 නොවැම්බර් 24 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙන් අදාළ සැපයුම්කරු දකුණු ආසියානු කලාපයේ TGM ඇඹරුම් යන්ත්‍ර අමතර කොටස් සැපයීමේ නියෝජිතයා හේතුවෙන් එම ආයතනයෙන් අදාළ උපාංගය මිලදී ගැනීම යෝග්‍ය බවට නිර්දේශ ලබාදී තිබුණද ප්‍රසම්පාදනයේ වටිනාකම, භාණ්ඩයේ පිරිවිතරයන් සහ තරඟකාරී සැපයුම්කරුවන් පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර නොතිබුණි. අදාළ භාණ්ඩය 2023 මැයි 10 වන දින ආයතනයේ ප්‍රධාන ගබඩාව වෙත ලැබී තිබුණු අතර මේ සම්බන්ධයෙන් පත්කළ ආයතනික සාමාජිකයින්ගෙන් සැදුම් ලත් පරීක්ෂණ මණ්ඩලයක් විසින් 2023 ජුනි 12 දින ලබාදී ඇති වාර්තාව ප්‍රකාරව ඉල්ලුම් කරන ලද සහ සත්‍ය වශයෙන් ආයතනය වෙත ලැබී ඇති Gear Box උපාංගයේ මාදිලියේ වෙනසක් ඇති බැවින් උපාංගය පිළිගත නොහැකි බවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව විගණිත දින වූ 2023 ඔක්තෝබර් 05 දක්වා මෙම උපාංගය ගබඩා ලේඛනවලට ඇතුළත් කිරීමකින් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණු අතර මිලදී ගැනීමේදී සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ | මිලදී ගැනීම සම්බන්ධයෙන් දැනටමත් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදුවෙමින් පවතින අතර. අල්ලස් හා දූෂණ කොමිසම් සභාව විසින්ද, පරීක්ෂණ පවත්වාගෙන යනු ලබයි. එසේම මෙම ගැටළුව ශ්‍රේෂ්ඨාධිකරනයේ පවතින නඩුවකට අදාලව නඩු නිමිත්තක් වශයෙන් පවතී. ඒ අනුව එම වාර්තා ද පදනම්ව මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. කෙසේ වෙතත්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු සැලසුම් කර ඇත. ඉංජිනේරු මහතුන්ගේ නිර්දේශ මත දේශීයව මිලදී ගත හැකි සියළු යන්ත්‍ර කොටස් හා අමතර කොටස් රටතුලම නිෂ්පාදනය කර මිලදී ගැනීමටත්, එසේම විදේශයන්ගෙන් අනිවාර්යයයෙන්ම ආනයනය කලයුතු අමතර කොටස් ජාත්‍යන්තර මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රමවේද හරහා සිදු කිරීමටත්, සැලසුම් කර ඇත. | අවිධිමත් ප්‍රසම්පාදනයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. වගකීම් කාලය තුළ නිවැරදි උපාංගය ලබා ගැනීමට සැපයුම්කරු සමඟ එකඟතාවයකට එළඹීමට වහාම කටයුතු කළ යුතුය. මිලදී ගැනීම් සිදු කිරීමේදී තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලි අනුගමනය කිරීමට සෑම විටම කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සැපයුම්කරු සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකිව තිබුණි. මිලදී ගැනීමට අදාළ ඇණවුමේ වටිනාකම වූ රු.4,802,850 (ඇ.එ.ජ.ඩො.13,000) සම්පූර්ණයෙන්ම සැපයුම්කරු වෙත 2022 සැප්තැම්බර් 15 දින ගෙවා තිබුණි. උපාංගය සඳහා මාස 15 ක වගකීම් කාලයක් සැපයුම්කරු විසින් ලබාදී තිබුණද විගණිත දින වූ 2023 ඔක්තෝබර් 05 දින වන විටත් එයින් මාස 07 ක කාලයක් අවසන්ව පැවතුණි. | | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ කාර්ය මණ්ඩලය තුළ වූ ප්‍රාථමික මට්ටමේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ අනුමත තනතුරු සංඛ්‍යාව 14 ක් වූ අතර ඉන් සියයට 50 ක් එනම් තනතුරු 7 ක් පුරප්පාඩුව පැවතුණි. එම මට්ටමේ නිෂ්පාදන සහායක තනතුරු 90 න් 7 ක් පුරප්පාඩුව පැවතියදී සේවකයන් 33 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | ඉදිරියේදී නිසි ක්‍රමවේදය ඔස්සේ සම්මුඛ පරික්ෂණයක් පවත්වා සුදුසුකම් පරික්ෂා කර බඳවාගැනිමේ පරිපාටියට අනුව තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. | මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. අතිරික්ත කොන්ත්‍රාත් සේවකයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විමසා සුදුසු පියවර ගත යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 පෙබරවාරි 28 දින සංශෝධනය කර තිබුණු සමාගමේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පරිසර හිතකාමී සහ නවීන ක්‍රියාවලියක් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වීම තුළින් පොස්පේට් පොහොර සඳහා වන ජාතික අවශ්‍යතාවය සපුරාලීම නම් වූ සමාගමේ මෙහෙවරට අනුකූලව සමාලෝචිත වර්ෂය තුළ දී කාර්යභාරයන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර රු.168,600,000 ක ප්‍රතිපාදන මත නිෂ්පාදන හා සේවා වැඩසටහන යටතේ ව්‍යාපෘති 05 ක් හා යටිතල පහසුකම් සංවර්ධනය යටතේ එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණි. | ආයතනයේ අලෙවි කටයුතු හා මෙහෙයුම් කටයුතුවල සිදුවූ සියයට 50 ක පමණ පසුබෑම හා කඩා වැටීමත්, ආයතනයේ දෛනික කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොලැබීමත්, බැංකු අයිරාවක් හරහා මූලික වියදම් පියවා ගැනීමට සිදුවීම වැනි කරුණු පදනම්ව, වර්ෂය ආරම්භයේදී සැලසුම් කරන ලද බොහෝමයක් ක්‍රියාකාරකම් අත්හිටුවීමට හෝ ප්‍රමාද කිරීමට කළමණාකාරීත්වයට සිදුවිය | සමාගමේ මෙහෙවරට අනුකූලව කාර්යභාරයන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |